# කැලණිය විශ්වවිද්‍යාලයීය උපාධිධාරී ව්‍යවසායක වෙළෙඳ ප්‍රදර්ශනය - 2024 (GEES) සාර්ථකව අවසන්









කැලණිය විශ්වවිද්‍යාලයීය විද්‍යාර්ථයන්ගේ නිර්මාණශීලී ව්‍යවසායකත්ව කුසලතා ප්‍රදර්ශනය කරනු වස් වෘත්තීය මාර්ගෝපදේශ ඒකකය හා ව්‍යවසායකත්ව සංගමය එක්ව සංවිධානය කරනු ලැබූ උපාධිධාරී ව්‍යවසායක වෙළෙඳ ප්‍රදර්ශනය - 2024 (GEES) නොවැම්බර් මස 06 වැනි දින කැලණිය විශ්වවිද්‍යාලයීය වෘත්තීය මාර්ගෝපදේශ ඒකක පරිශ්‍රයේදී අති සාර්ථක ලෙස විශාල පිරිසකගේ සහභාගිත්වයෙන් පවත්වන ලදී. දෙවැනි වරටත් අභිමානවත් ලෙස සංවිධානය කරන ලද මෙම උපාධිධාරී ව්‍යවසායක වෙළෙඳ ප්‍රදර්ශනය සඳහා විශ්වවිද්‍යාලයීය උපාධිධාරී ව්‍යවසායකයන් හතළිස් දෙදෙනකුගේ නිර්මාණාත්මක හා ඔවුන්ගේම දෑතින් නිමවූ වෙළෙඳ භාණ්ඩ රැසක් ප්‍රදර්ශනය හා අලෙවිය සඳහා ඉදිරිපත් වූ අතර ඉතා ඉහළ ඇගයීමක් හා ඉල්ලුමක් ඒ සඳහා හිමිවීම සුවිශේෂීය.

වෘත්තීය මාර්ගෝපදේශ ඒකක මඟින් විශ්වවිද්‍යාලය තුළ මෙවැනි ව්‍යවසායක වෙළෙඳ ප්‍රදර්ශනයක් සංවිධානය කරන ලද්දේ විශ්වවිද්‍යාලයීය විද්‍යාර්ථයන් අතර ව්‍යවසායකත්ව සංස්කෘතියක් ගොඩනැඟීම මඟින් ශිෂ්‍ය ව්‍යවසායකයන් සහ කුඩා ව්‍යාපාරවල යෙදී සිටින විද්‍යාර්ථයන්ට තම නිර්මාණාත්මක ව්‍යවසායකත්ව අදහස් හා කුසලතා සැබෑ ව්‍යාපාර ලෝකය වෙත රැගෙන යෑමට දිරිගැන්වීමටත්, මේ වන විටත් ව්‍යවසායකයන් බවට පත්ව ඇති විද්‍යාර්ථයන්ට තම නිර්මාණාත්මක අදහස් හා කුසලතා එළිදැක්වීමට හා ප්‍රවර්ධනය සඳහා අවශ්‍ය වේදිකාවක් නිර්මාණය කිරීමත් යන මූලික අරමුණු සහිතවය.

මෙහිදී විද්‍යාර්ථයන්ගේම නිර්මාණ හා නිෂ්පාදන වන නැවුම් ආහාරපාන, විසිතුරු භාණ්ඩ, කුළුබඩු, ඇඳුම් පැළඳුම්, තෑගි භාණ්ඩ, බෑග්/පර්ස්, ලිපිද්‍රව්‍ය, ආභරණ, චිත්‍ර නිර්මාණ, බතික් ඇඳුම් හා නිර්මාණ, විසිතුරු පැළ ඇතුළු වෙළෙඳ භාණ්ඩ රැසක් ප්‍රදර්ශනය හා අලෙවිය සඳහා ඉදිරිපත් කොට තිබිණි.

කැලණිය විශ්වවිද්‍යාලයේ උපකුලපති මහාචාර්ය නිලන්ති ද සිල්වා මැතිනිය මෙහි ප්‍රධාන ආරාධිත අමුත්තා ලෙස සහභාගි වූ අතර වෘත්තීය මාර්ගෝපදේශ ඒකකයේ අධ්‍යක්ෂ ජ්‍යෙෂ්ඨ මහාචාර්ය දිල්කුෂී වෑත්තෑව මහත්මිය හා පීඨාධිපතිවරුන් වන ජ්‍යෙෂ්ඨ මහාචාර්ය එස්. ආර්.ඩී. කාලිංගමුදලි මහතා - විද්‍යා පීඨය, මහාචාර්ය බණ්ඩාර වන්නිනායක මහතා - වාණිජ හා කළමනාකරණ පීඨය, ආචාර්ය සුදත් සෙනරත් මහතා - මානව ශාස්ත්‍ර පීඨය, කැලණිය ප්‍රාදේශීය ලේකම් ඒ.ඒ.ඩී.සී. අමරසිංහ මහත්මිය, ජාතික ව්‍යවසායක සංවර්ධන අධිකාරියේ සභාපති/අධ්‍යක්ෂ ජනරාල් ඩබ්.ටී.ආර්. චන්දිමා මහත්මිය, ජාතික ව්‍යවසායක සංවර්ධන අධිකාරියේ අධ්‍යක්ෂ ධනුක ලියනගමගේ මහතා, ජාතික ව්‍යවසායක සංවර්ධන අධිකාරියේ ව්‍යවසායක ප්‍රවර්ධන නිලධාරිනි භාග්‍යා නාකන්ද, කැලණිය ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ ව්‍යවසායක සංවර්ධන නිලධාරිනි ඩබ්.ඒ.ඩී.එස්. ප්‍රින්සි විතානාරච්චි හා විශ්වවිද්‍යාල ආචාර්යවරුන්, වෘත්තීය මාර්ගෝපදේශ උපදේශකවරුන් වන විරාජ් අභයසිංහ මහතා හා මිනෝන් පෙරේරා මහත්මිය ඇතුළු බොහෝ පිරිසක් සමාරම්භක අවස්ථාව සඳහා සහභාගි වූහ.

# මර්කන්ටයිල් ඉන්වෙස්ට්මන්ට්ස් කැකිරාවේදී සහ වවුනියාවේදී සිය නව ශාඛා විවෘත කරයි

මර්කන්ටයිල් ඉන්වෙස්ට්මන්ට්ස් සමාගම විසින් සිය ශාඛා ජාලය දිවයින පුරා ශීඝ්‍රයෙන් ව්‍යාප්ත කිරීම මූලික කරගනිමින් එම ආයතනයේ නවතම ශාඛා දෙකක් වවුනියාව සහ කැකිරාව යන නගරවලදී පසුගියදා විවෘත කරන ලදී.

ඒ අනුව මර්කන්ටයිල් ඉන්වෙස්ට්මන්ට්ස් සමාගමේ 62 වැනි ශාඛාව 2024 ඔක්තෝබර් 24 වැනි දිනයේදී වවුනියාවේ අංක 18, දෙවැනි හරස් වීදියේදී නිල වශයෙන් විවෘත කෙරුණු අතර, 63 වැනි ශාඛාව 2024 ඔක්තෝබර් 25 වැනි දින කැකිරාව, තලාව පාරේ ඒ.එම්. දිසානායක ගොඩනැඟිල්ලේදී විවෘත කෙරිණි. මෙම උත්සව සඳහා මර්කන්ටයිල් ඉන්වෙස්ට්මන්ට්ස් සමාගමේ ප්‍රධාන මෙහෙයුම් නිලධාරී ලක්සඳ ගුණවර්ධන මහතා ප්‍රධාන ජ්‍යෙෂ්ඨ කළමනාකාරිත්වය, ගෞරවනීය ගනුදෙනුකරුවෝ ඇතුළු සම්භාවනීය අමුත්තෝ රැසක් සහභාගි වූහ.

මර්කන්ටයිල් ඉන්වෙස්ට්මන්ට්ස් සමාගමේ වවුනියා ශාඛා කළමනාකරු විනෝත් කුමාර් සහ කැකිරාව ශාඛා කළමනාකරු ජයාන් මාලිංග යන මහත්වරුන්ගේ නායකත්වයෙන් ක්‍රියාත්මක කෙරෙන මෙම නව ශාඛා ද්විත්වය හරහා ගනුදෙනුකරුවන්ගේ පෞද්ගලික හා ව්‍යාපාරික මූල්‍ය අවශ්‍යතා සපුරාලීම සඳහා පුළුල් මූල්‍ය සේවා රැසක් ලබා දෙන අතර, ඒ හරහා ලබා දෙන සේවාවන් අතර ලීසිං, වාහන සඳහා ණය පහසුකම්, ස්ථාවර තැන්පතු, රන් ණය සහ ළමා ඉතුරුම් ගිණුම් ප්‍රධාන වේ.





# Metropolitan Technologies සංවිධානය කළ Canon Partner Awards Night සාර්ථකව අවසන් වේ



ශ්‍රී ලංකාව පුරා විසිරී සිටින Canon අලෙවිකරුවන් ඇගැයීමට Metropolitan Technologies පෞද්ගලික සමාගම වාර්ෂිකව සංවිධානය කරන Canon Partner Award 2023/2024 සම්මාන රාත්‍රිය මීගමුව 'Grandeeza' හෝටල් පරිශ්‍රයේදී පසුගියදා පැවැත්විණි. Canon සන්නාමය මෙරට වෙළෙඳපොළ තුළ ප්‍රචලිත කරමින් සාර්ථකත්වය කරා රැගෙන යෑමට දායක වූ 200කට වැඩි අලෙවිකරුවෝ පිරිසක් මෙම සම්මාන උළෙලට සහභාගි වූහ. එහිදී අදහස් දැක්වූ Metropolitan Group නියෝජ්‍ය සභාපති අයිවෝ මහරූෆ් මහතා සඳහන් කළේ වසර 66කට පෙර ආරම්භ වූ මෙම සමාගම වසර 50ක් පුරා මෙරට එකම බලයලත් Canon නිෂ්පාදන බෙදා හරින්නා ලෙස කටයුතු කර ඇති බවයි.

Canon සන්නාමය මෙරට වෙළෙඳපොළේ ප්‍රචලිත කිරීමට මෙම දිගුකාලීන සහයෝගිතාව ප්‍රධාන හේතුවක් වී ඇත. Canon Marketing Asia සමාගමේ ඩිජිටල් මුද්‍රණ සහ ව්‍යාපාර විසඳුම් සඳහා වන කලාපීය අංශයේ අධ්‍යක්ෂ ටූ කොක් යොං මහතා පැවැසුවේ 2024 මුල් මාස හය තුළ මෙරට මුද්‍රණ යන්ත්‍ර වෙළෙඳපොළේ ප්‍රථමයා වීමට Canon සන්නාමයට හැකි වූ බවයි. Metropolitan Technologies සහකාර සාමාන්‍යාධිකාරී ප්‍රවීන් සමරකෝන් මහතා, Canon මුද්‍රණ යන්ත්‍ර (Printers) ප්‍රවර්ධනයට Metropolitan සමඟ අත්වැල් බැඳ ගන්නැයි දිවයින පුරා අලෙවිකරුවන්ට ඇරැයුම් කළේය. වර්තමානයේදී අලෙවිකරුවන්ගේ වර්ධනය ඉලක්ක කරගත් ප්‍රවර්ධන වැඩසටහන් රැසකුත්, පාරිභෝගිකයන් ආකර්ෂණය කර ගැනීමේ වැඩසටහනකුත් සැලසුම් කර ඇති බවද ඔහු පැවැසුවේය. Recognition Awards, Excellence Awards, Elite Awards යනුවෙන් කාණ්ඩ තුනක් යටතේ සම්මාන 31ක් ප්‍රදානය කරන ලදී. Canon සන්නාමය ප්‍රචලිත කිරීමට විශිෂ්ටතම දායකත්වය දැක්වූ අලෙවිකරුවන් තිදෙනා Elite Top Performer සම්මානයෙන් පිදුම් ලැබීය. Accell Technology Holding පළමු ස්ථානයත්, Printers LK දෙවැනි ස්ථානයත්, IT Galaxy තෙවැනි ස්ථානයත් දිනා ගත්තේය. Barclays Computers, Digital Media Center, Elinext IT, IT Hub, Sense Micro Distributions, Techno Forms, VYS International වෙත Elite Top 10 Partner Awards පිරිනැමිනි. Modern Trade Excellence 2023/2024 සම්මානය Singer Sri Lanka සමාගමටත්, රාජ්‍ය සේවා විශිෂ්ටතා සම්මානය ශ්‍රී ලංකා රාජ්‍ය වාණිජ (විවිධ) නීතිගත සංස්ථාවටත් හිමි විය.

# SUCCEED DESIGN සමාගම සිය නව වෙබ් අඩවිය දියත් කිරීම සඳහා SLT-SERVICES සමඟ ගිවිසුම්ගත වෙයි

ශ්‍රී ලංකාවේ ප්‍රමුඛ පෙළේ Interior Design සමාගමක් වන SUCCEED DESIGN, තම නව වෙබ් අඩවිය (succeeddesign.lk) දියත් කිරීම සඳහා මෙරට පුරෝගාමී ඩිජිටල් සේවා සම්පාදන සමාගමක් වන SLT-SERVICES සමඟ පසුගියදා ගිවිසුම්ගත විය. මෙම හවුල්කාරිත්වයේ අරමුණ වන්නේ, SUCCEED DESIGNහි නිර්මාණශීලීත්වය, නවෝත්පාදනය සහ පාරිභෝගික තෘප්තිය සඳහා වූ කැපවීම පිළිබිඹු කරන වෙබ් අඩවියක් නිර්මාණය කිරීම, එහි ඩිජිටල් පැවැත්ම වැඩිදියුණු කිරීම සහ ආකර්ෂණීය පරිශීලක අත්දැකීමක් ලබා දීමයි.

SUCCEED DESIGN සමාගම යනු තම සේවාදායකයන්ගේ පෞද්ගලික හෝ සන්නාම අනන්‍යතා මැනැවින් නිරූපණය වන පරිදි අභ්‍යන්තර නිර්මාණකරණ කටයුතු සිදු කිරීම සම්බන්ධයෙන් දේශීය හා ජාත්‍යන්තර වශයෙන් විශාල කීර්තියක් දිනා සිටින සමාගමකි. එම සමාගම පිරිනමන සේවා මෙන්ම සමාගමේ නිර්මාණකරණ දර්ශනය සහ නිපුණත්වය පිළිබඳව සේවාදායකයන්ට පැහැදිලි අවබෝධයක් ලැබෙන ආකාරයට නව වෙබ් අඩවිය සැලසුම්කර තිබේ.

SLT-SERVICES යනු Sri Lanka Telecom PLCහි අනුබද්ධ සමාගමකි. එම සමාගම වෙබ් නිර්මාණකරණය, SEO සහ ඩිජිටල් අලෙවිකරණය සම්බන්ධයෙන් විශේෂඥ පළපුරුද්දක් ඇති සමාගමක් ලෙස සැලකේ. විශේෂයෙන්ම ව්‍යාපාරවලට අන්තර්ජාලය තුළ සාර්ථක වීම සඳහා උපකාරීවන ඉහළ ගුණාත්මකභාවයකින් යුත්, පාරිභෝගික කේන්ද්‍රීය වෙබ් අඩවි නිර්මාණය කිරීමට SLT-SERVICES කැප වී සිටී. මේ නිසා නව හවුල්කාරිත්වය ඔස්සේ තම ඩිජිටල් හැකියා වැඩිදියුණු කරගනිමින් නව ජාත්‍යන්තර වෙළඳපොළවලට පවා පිවිසීමට SUCCEED DESIGN සමාගමට හැකියාව ලැබෙනු ඇතැයි අපේක්ෂා කෙරේ.

ගිවිසුම අස්සන් කළ අවස්ථාවේදී මෙම හවුල්කාරිත්වය සම්බන්ධයෙන් සමාගම් දෙකේම ප්‍රධානීහු සතුට පළකළහ. Succeed Interiorsහි කළමනාකාර අධ්‍යක්ෂ දිනේෂ් නාකන්දල මහතා, සමාගම මඟින් ලබාගත හැකි සේවා ප්‍රදර්ශනය කිරීමේදී සහ පාරිභෝගිකයන් සමඟ සම්බන්ධ වීමේදී වෙබ් අඩවිය මඟින් ඉටුවන කාර්යභාරයෙහි වැදගත්කම අවධාරණය කළේය. SLT-SERVICESහි ප්‍රධාන ඩිජිටල් සේවා නිලධාරී උපුල් මංචනායක මහතා පෙන්වා දුන්නේ, ව්‍යාපාර මෙහෙයුම් පෙරළියකට ලක්කරමින් නව වෙළෙඳපොළ වෙත ව්‍යාප්ත වීමට අවස්ථා සලසා දීම සඳහා මෙම හවුල්කාරීත්වයට හැකියාව ඇති බවයි.



කොළඹ 07, රොස්මිඩ් පෙදෙස්, අංක 101 හි පිහිටි සීමාසහිත සිලෝන් නිව්ස්පේපර්ස් පෞද්ගලික සමාගම විසින් ජා ඇල, මිනුවන්ගොඩ පාරේ, 302/1/A හි පිහිටි සිය මුද්‍රණාලයේදී මුද්‍රණය කරනු ලැබ ප්‍රසිද්ධ කරන ලදී.